# ලංකාවිත්ති
# LANKA VITHTHI

මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුමිය!
Mother and Motherland are nobler than Heaven



FOR FREE CIRCULATION
නොමිලේ බෙදාහැරීම පිණිසයි
VOLUME 13
NUMBER 01

ලොව කොතැනවුව වෙසෙන සිංහලයින් සඳහා ලන්ඩනයේ මුද්‍රිත සිංහල පුවත් පත
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.

APRIL 10, 2010 අප්‍රියෙල් මාසය (බුද්ධ වර්ෂ 2553 බක් මාසය)

http://www.lankaheritage.com/lankaviththi/


**ඔබ සැමට සුබ සිංහළ අළුත් අවුරුද්දක් වේවා !**



අවුරුදු කුමාරි

හෂිනි
**Hashini**

*Photo* - Pradeep Nishantha Herath ජායාරූපය - ප්‍රදීප් නිශාන්ත හේරත් *Sri Lanka*

# රටටම අවුරුදු

♦ සංජය විමලරත්න විසිනි

## ත්‍රස්තවාදයෙන් නිදහස් රටක්! සන්ධානයට විශිෂ්ට ජයක්!

**මෙ**වර ශ්‍රීලංකාද්වීපයට උදාවන සිංහල අළුත් අවුරුද්ද ඉතිහාසයේ අන් කවර දාකටවත් වඩා වටිනාකමින් යුක්ත අවුරුද්දක් බව එක හෙළා කිව හැකිය. මූලික වශයෙන් අප රට ගිලී තිබූ බිහිසුණු ත්‍රස්තවාදී අන්ධකාරයෙන් රට මුදාගෙන, බියෙන් සැකෙන් තොරව නිදහසේ සුවය විඳිමින් රටපුරාම ජන තාව එකපැහැර ප්‍රීති උද්දාමයට පත්වෙමින් පවත්වන ජාතික උත්සවය එය වීමයි.

එසේම අප රටට එරෙහිවූ දේශීය විදේශීය කුමන්ත්‍රණකාරී සතුරන්ට දැවැන්ත කනේ පහරක් ගසමින් අප ජනතාව ව්‍යසනයෙන් රට ගොඩගත් වර්තමාන රජය බහුතර ආසන සංඛ්‍යා වක් සහිතව පාර්ලිමේන්තුවට තෝරා පත්කර ගැන්මයි. ජනාධිපතිතුමාගේ වචන වලින්ම කියනවා නම් එම ජය ග්‍රහණය පැහැදිලිව සනිටුහන් කරන් නේ ශ්‍රීලංකාවේ වෙසෙන කෘතවේදී බහු තර ජනතාව ඡන්ද කතිරයෙන් තම ස්තුතිය වර්තමාන රජය වෙත පුදකරන ලද ආකාරයයි.

අද අප රට ත්‍රස්තවාදයෙන් ලබා ඇති නිදහස කොතරම් වටිනවාදැයි අප වටහාගත යුත්තේ ඇමරිකාව රුසියාව වැනි ලොව බලවත් රටවල් පවා අද ත්‍රස්තවාදයෙන් බැටකමින් එය මැඩ පවත්වා ගත නොහැකිව දහලන ආකාරය සැලකිල්ලට ගනිමිනි. ඉන්දියාව පකිස්ථානය ඇප්ඝනිස්ථානය පලස්තීනය ආදී රටවල දිනපතා බෝම්බ පුපුරයි. අප ද එවැනි අවාසනාවන්ත තත්වයක වසර 30 කට ආසන්න කාලයක් පත්ව සිටියෙමු. අප රටේ වාසනාවට රට ව්‍යසනයෙන් මුදාගත හැකි නායකයෙකු බිහිවිය. කිසි දිනක අවසන් කළ නොහැකියයි මුළු ලොවම හඬනගා කී ත්‍රස්තවාදී යුද්ධය වසර හතරක් තුළ මුළුමනින් අප රටින් තුරන්කර දමන්නට හැකිවූයේ ඉන් අනතුරුවය. අවුරුදු 30 ක් පුරා බියෙන් හැකිලී සිටි ජනතාවක් අද පූර්ණ නිදහස ලබා රටේ සියළු දෙස බියෙන් සැකෙන් තොරව ගැවසෙති. කලින් වසර වල සිංහළ අවුරුද්ද ජනතාව සමරන ලද්දේ චාරිත්‍රයක් ඉටුකරනු පිණිස මිස සිතේ ප්‍රීතියකින් නොවේ. අවුරුදු දිනවල බෝම්බ පුපුරවන්නේ හෝ මිනිස් ඝාතන සිදුකරන්නේ නැතැයි කියා කොටි ත්‍රස්තවාදීන්ගේ නායකයාගෙන් කිසියම් පොරොන්දුවක් ලැබෙන තුරු ජනතාවද, එකල තිබූ රජයයන්ද බලා සිටි සැටිත්, ඒ පොරොන්දුව කොටි දුන්විට, එය ලොකු අකුරෙන් "මෙදා අවුරුද්ද සමරන්න අපි සිංහළ ජනතාවට ඉඩ දෙනවා එල්ටීටීඊ කොටි නායකයා කියයි" යනුවෙන් පුවත් පත් වල මුල් පිටේ අවුරුද්දට දින කීපයකට පෙර පළකර තිබූ අයුරුත් අපට මතකය. එකල කොළඹ ආණ්ඩු එවැනි නිවට තත්වයක වැටී සිටි බව අප අමතක කළ යුතු නොවේ. එය මෙහි සඳහන් කළේ ඒ නිසා ය.

ශ්‍රීලංකාව කොටි ත්‍රස්තවාදය අවසන් කිරීම ගැන යුරෝපා රටවල් කීපයක් හැර අන් සියළු රටවල් අප රජයට ප්‍රසාදය පළකර අයුරු අපි දුටුවෙමු. කොටින්ට උදව් කළ නෝර්වේ එංගලන්තය වැනි රටවල් තුළ ඇත්තේ අප කෙරෙහි කිසියම් ඊර්ෂ්‍යාවකි. ඒ රටවල පුවත් පත් තවමත් කරන්නේ ලංකා රජයට මඩ ගැසීමය. එක්සත් ජාතීන්ගේ මණ්ඩලය ලවා ලංකාව මට්ටු කරන්නට ඔව්හු මහන්සි ගනිති.

බටහිර රටවල එරවිලි ගෙරවිලි තුට්ටුවකටවත් නොගෙන ලංකා රජය රට සංවර්ධනයෙහි නියැලී සිටියි. මංමාවත් අළුතින් ගොඩ නගමින්ද, පරණ මාවත් අළුත්වැඩියා කරමින්ද රජය ගමටත් නගරයටත් එකසේ සලකන්නට කටයුතු කරයි. කලින් වතාවලට වඩා කුඹුරු අස්වැද්දීම දැන් සිදුවේ. කොටි ත්‍රස්තවාදය නිසා මුළුමනින්ම අඩපණ වී තිබුණ උතුරේ හා නැගණහිර ජනජීවිත විශාල පිබිදීමකට ලක්වෙමින් පවතී. අද උතුරේ වඩ වඩා එළවළු වගාව හා ධීවර කර්මාන්තය සිදුවන අතර ඒ ද්‍රව්‍ය දැන් තොග ගණනින් කොළඹට පැමිණේ. මේ සියල්ල යුද්ධයේ නිමාවීමත් සමග රජය සැළසුම් සහගතව ආරම්භ කරන ලද කාර්‍යයන්හි සෘජු ප්‍රථිඵල වෙති.

මුලින් කීවාක්මෙන් මෙම සිංහළ අවුරුද්ද සැක සංකාවෙන් තොරව වසර 30 කට පසු නිදහසේ ප්‍රීති වන සිංහළ අවුරුද්ද බවට පත්ව ඇත. එම නිදහස යළි කිසි දිනක නැතිකර නොගන්නට අප තරයේ සිතට ගත යුතුය.

**4 වන පිටුව බලන්න** ➛

තිස් වසරක් පුරා රුදු යුද ගිනි ඇවිලි
දුක් වුණු රට නිවී අද බැඳ ජය කෙහෙළි
ලිප් උතුරවා පිස කිරිබත් රස කැවිලි
තොස්වන යුරු දකිමු හෙළ අවුරුදු කොමළී

**War flames that engulfed Lanka for thirty years**
**Have finally doused amidst fluttering victory flags**
**This day every house makes sweets and milk rice**
**To revel in New Year with the spectacular Sun-rise**

♦ *දයා ආනන්ද රණසිංහ* ♦ *Daya Ananda Ranasinghe*




අපගේ හිතවත් ගණුදෙනුකාර හවතුන් සැමට
සාමය සතුට පිරී,
සුබ නව වසරක් වේවා!

FAST CASH
SEND TODAY - COLLECT TODAY


විස්තර පිටු අංක 3